**දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල - 2019**
**-----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මතය**
**-------**

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 2019 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.544,920 ක ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 989,505 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.444,585 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රජයේ ප්‍රදානය රු.1,000,000 කින් වැඩිවුවද අධ්‍යාපන හා සංස්කෘතික ආධාර රු.3,178,786 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරුත්ථාපන වැඩ සටහන යටතේ අන්ධ ජන සම්මේලනය මගින් දෘශ්‍යාබාධිත පුද්ගලයන් 15 දෙනෙකු වර්ෂය තුළදී පුහුණුකිරීම සඳහා සැළසුම් කර තිබුණද දෘශ්‍යාබාධිත පුද්ගලයන් 4 දෙනෙකුට පමණක් පුහුණුව ලබාදී තිබුණි. කෙසේ වුවද එම පුහුණුව සඳහා පුහුණු නිලධාරීන් ඇතුළු 6 දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයකට මෙම අරමුදලින් දීමනා ලබාදී තිබුණි. තවද ඉකුත් වර්ෂ 04 ඇතුළතද මෙම තත්ත්වය එලෙසම පැවති අතර පුහුණුලාභීන් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර පුහුණුව ලබාදීම සම්බන්ධව පවත්නා ගැටළු පිළිබඳ වාර්තාවක් සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණද ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ව්‍යාපෘති සඳහා සම්බන්ධ වනුයේ පසුකාලීනව දෘශ්‍යාබාධිතභාවයට පත්වූ පුද්ගලයන්ය. එවැනි පුද්ගලයින් ඉතා අඩුවෙන් හමුවේ. එමෙන්ම කොළඹින් දුර බැහැර ප්‍රදේශවල සිටින සේවාලාභීන් හට එම පහසුකමක් ලබා ගැනිමට පැමිණීමට අපහසුවේ. සේවාලාභින් සංඛ්‍යාව අඩුවුවද මේ සඳහා වැයකල යුතුව පවතින උපදේශක දිමනා ප්‍රමාණය වෙනස් නොවේ. | අන්ධ ජන සේවා මණ්ඩලය සමඟ සම්බන්ධවී මෙම පුහුණු කටයුතු වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි ප්‍රයෝජනවත් වන ආකාරයට සැලසුම්කර පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වීම |
| (ආ) | අරමුදලේ ප්‍රතිපාදන මගින් සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ පුහුණුලාභී දෘශ්‍යාබාධිතයන් සඳහා පවත්වාගෙන යනු ලබන අත්යන්ත්‍ර පේෂකර්ම සුභ සාධන මධ්‍යස්ථානයේ උපදේශිකාව ඉවත්වීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ ජනවාරි සිට එම මධ්‍යස්ථානයේ නිෂ්පාදන කටයුතු සම්පූර්ණයෙන්ම නතර කර තිබුණි. නිෂ්පාදන කටයුතු නතරවීම පිළිබඳව වාර්තාවක් පාලක සභාවට ඉදිරිපත් කරන ලෙස ආයතනයේ ස්ථානභාර නිලධාරියා දැනුවත් කර තිබුණද එවැනි වාර්තාවක් 2020 අගෝස්තු 28 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. එසේම එම මධ්‍යස්ථානයේ ඉතිරිව පැවති රු.48,250 ක් වූ අත්යන්ත්‍ර අමුද්‍රව්‍ය හා පසුගිය වර්ෂයේ නිම කරන ලද රු.9,671 ක් වූ අත්යන්ත්‍ර නිමැවුම් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගතනොහැකිව පැවතිණි.. | දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය පිළිබඳ ආයතනයේ ස්ථානභාර නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව 2019-02.26 දින පැවති කළමණාකරන කමිටුව සඳහා ඉදිරිපත් කර ඇත . පුහුණු උපදේශිකාවක් නොමැතිවීම සහ නිෂ්පාදන කටයුතු සඳහා දෘශ්‍යාබාධිත කාන්තාවන් සොයා ගැනිමේ අපහසු වීම නිසා මෙහි නිෂ්පාදන කටයුතු නතර වි ඇත. . එමෙන්ම මෙම දෘශ්‍යාබාධිත කාන්තා සුභ සාධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාම තව දුරටත් අපහසු වන්නේ නම් එය අත්හැර දැමිය යුතු බවට 2020.03.04 දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. ඉතිරි අමුද්‍රව්‍ය සහ නිමිද්‍රව්‍ය තාවකාලිකව සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ ගබඩා බාරකරු බාරයේ පවතී. | දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට සේවා සපයන ආයතනයක් ලෙස ඔවුන්ගේ යහපත හා සුභසාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුවේ. ඒ අනුව මෙම පුහුණු මධ්‍යාස්ථානය ඒ වෙනුවෙන් උපරිම ආකාරයෙන් භාවිතා කිරීම සඳහා අවශ්‍ය කටයුතු කල යුතුවීම උපකෘත පාසැල් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජ සේවා නිලධාරීන් සමඟ සම්බන්ධවී කටයුතු කිරීමෙන් පුහුණුවන්නන් පිළිබඳ තොරතුරු ලබාගත යුතුවීම. |
| (ඇ) | පනතේ අරමුණක් වශයෙන් දක්වා ඇති දෘශ්‍යාබාධිතයන්ට ශාස්ත්‍රීය පාඨමාලා හැදෑරීමට හෝ වෘත්තීය පුහුණුව ලබාගැනීමට හැකිවනු පිණිස ඔවුන්ට නිවාස පහසුකම් | දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල වෙත ලැබෙන ප්‍රතිපාදන සීමිත වීම නිසා දක්වා ඇති පරිදි නිවාස පහසුකම් සැපයීම සීමා වී ඇති අතර | මෙම පරමාර්ථ 02 ක දෘශ්‍යාබාධිතයින් සඳහා ඉතා වැදගත්වන බැවින් එම අරමුණ ක්‍රියාවට |

| | | | |
|---|---|---|---|
| | සැපයීම සහ දෘශ්‍යාබාධිතයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා අලෙවි පහසුකම් සැපයීම යන අරමුණු 02 ක ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන වෙන්කර ගෙන නොතිබුණි. | දෘශ්‍යාබාධිතයින් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සීඝ්‍රව වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන දිරිය පොල මගින් අළෙවි කිරීමට කටයුතු යොදා ඇත. | නැංවීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | 2003ජූනි 03 දිනැති අංක පීඊඩී/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 4.2.2 වගන්තිය අනුව පාලක සභා රැස්වීම් මාසිකව පැවැත්විය යුතු බව දක්වා ඇතත්, අරමුදලේ කටයුතු පවත්වාගෙන යාමට එහි පාලක මණ්ඩලය සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණු රැස්වීම් වාර 07 ක් ඇතුළතදී දෘශ්‍යාබාධිතයින් සුභසාධනයට අවශ්‍ය මූලික අරමුණු වැඩිදියුණු කිරීම් ක්‍රමවේදයන් කිසිවක් ඉදිරිපත් කර නොතිබුණි. | අරමුදලේ අවශ්‍යතාවය පරිදි රැස්වීම් පැවැත්වීම තීරණය කරනුයේ ගරු සභාපති තුමා ඇතුලු කළමණාකරන මණ්ඩලය විසිනි. ඒ අනුව මාසිකව රැස්වීම් පැවැත්වීමට වඩා අවශ්‍යතාවය පරිදි රැස්වීම් පැවැත්වීම වඩාත් ඵලදායකය. අරමුදල හෝ එමගින් මූල්‍යාධාර ලබන දෘශ්‍යාබාධිත සංවිධාන ව්‍යවසාය කටයුතු සිදු නොකරන සේවා සපයන සංවිධානවේ. | අරමුදලේ මූලික අරමුණු ඉටුකර ගැනීමට හැකිවන අයුරින් පාලක සභාව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | අක්ෂි ආබාධ සහිත පුද්ගලයන් 05 දෙනෙකුට අක්ෂිකාච ලබාදීම සඳහා රු.100,000 ක ප්‍රතිපාදනයෙන් පුද්ගලයන් 04 දෙනෙකුට රු.53,800 ක් වැයකර අක්ෂි කාච ලබාදී රු.46,200 ක් ඉතිරිව පැවතිණි. එසේම අක්ෂිකාච ලබාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබීමේ හේතුවෙන් ප්‍රතිපාදිත මුදල් උපරිමව උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණි. | රජයේ රෝහල් මගින් සහ වෙනත් ස්වේච්ඡා සංවිධාන නොමිලයේ අක්ෂිකාච ලබාදිමේ වැඩසටහන් ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා අරමුදල වෙත ලැබෙන ඉල්ලීම් අඩුවී ඇත. ලැබෙන ඉල්ලීම් වලට අනුව 2019 වර්ෂයේ අරමුදල මගින් අක්ෂි කාච හතරක් නිකුත් කර ඇත. | දෘශ්‍යාබාධිතයන්ට ලබාදෙන සේවාවක් බැවින් ප්‍රමාණවත් ප්‍රචාරණයක් ලබාදීමේ වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුවීම. |